# 05

# ජාත්‍යන්තර සබඳතා

## හැඳින්වීම

අතීතයේ ලොව බොහෝ රටවල ස්වයං පෝෂිත අර්ථ ක්‍රමයක් පැවතුණ බව හඳුනා ගත හැකි ය. තමන්ට අවශ්‍ය දේ තමන් විසින්ම නිෂ්පාදනය කර ගැනීම හා පරිභෝජනය කිරීම ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක ලක්ෂණයකි. පසුව ජනගහනය වර්ධනය වීම හා ඊට සාපේක්ෂව මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම හේතු කොට ගෙන භාණ්ඩ සඳහා පවතින ඉල්ලුම වැඩි විය.

රටක භූගෝලීය පිහිටීම, දේශගුණික හා කාලගුණික තත්ත්වය, ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය ආදී කරුණු මත රටක නිපදවන භාණ්ඩ පිළිබඳ ව තීරණය කරනු ලැබේ. එහෙත් සම්පත්වල විවිධත්වය හේතු කොට ගෙන කිසිදු රටකට තමන්ට අවශ්‍ය සියලු භාණ්ඩ තම රට තුළ නිපදවා ගත නොහැක. එම නිසා සෑම රටක් ම තම රටේ පහසුවෙන් නිපදවිය හැකි භාණ්ඩ පමණක් නිපදවන අතර තමන්ට අවශ්‍ය අනෙක් භාණ්ඩ වෙනත් රටවලින් ආනයනය කරනු ලැබේ.

මධ්‍යතන යුගයේ යුරෝපය තුළ ඇති වූ නව සොයා ගැනීම් හා දේශ ගවේෂණ කටයුතුවල දියුණුව නිසා රටවල් අතර ගනුදෙනු හා සම්බන්ධතා වර්ධනය විය. යුරෝපය හා පෙරදිග රටවල් අතර සම්බන්ධතා ගොඩනගා ගැනීම එහි ප්‍රතිඵලයකි. කාර්මික විප්ලවය සමඟ යුරෝපයේ නිෂ්පාදන ශීඝ්‍ර ලෙස වර්ධනය වූ අතර ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම ද අවශ්‍ය විය. එමෙන් ම නිපදවන භාණ්ඩ අලෙවි කර ගැනීම සඳහා වෙළඳ පොළක් සොයා ගැනීම ද අත්‍යවශ්‍ය විය. ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකානු ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් මෙම සෑම කාර්යයක් ම සිදු වුණ අතර ඒ සඳහා යුරෝපය විසින් යටත් විජිත ප්‍රතිපත්තිය කරා නැඹුරු විය. යටත් විජිත අත්පත් කර ගත් රටවල් යුරෝපය තුළ සංවර්ධිත රටවල් බවට පත් විය. එම රටවල ප්‍රාග්ධනය හා තාක්ෂණික ශක්තිය ද ඉහළ මට්ටමක විය. යටත් විජිත ලෙස වසර ගණනාවක් පැවති රටවල් ආර්ථික වශයෙන් අඩු දියුණු මට්ටමක පැවති අතර ප්‍රාග්ධනය හා තාක්ෂණික ශක්තිය අතින්ද පහළ මට්ටමක පැවතුණි. එම නිසා සංවර්ධිත රටවල් මත යැපීමට සංවර්ධනය වන රටවලට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස අන්තර් ජාතික සම්බන්ධතා වර්ධනය විය.

රටවල් අතර පවතින සහයෝගය මිනිසාගේ දියුණුවට අවශ්‍ය වේ. ජනගහණයේ ශීඝ්‍ර වර්ධනය, මිනිස් අවශ්‍යතාවල සංකීර්ණ බව, එම අවශ්‍යතා සපුරා ගැනීමේ මාර්ග

සීමිත වීම ආදී හේතු මත ලොව කිසිදු රටකට හුදකලාව පැවතිය නොහැකිය.

රටවල් අන්‍යෝන්‍ය සහයෝගයෙන් හා සුහදතාවෙන් කටයුතු කිරීම තුළින් සංවර්ධන ඉලක්ක සපුරා ගත හැකි ය. වර්තමාන බොහෝ රාජ්‍ය ආර්ථික, සමාජීය සහ සංස්කෘතික මට්ටමින් ඉහළට පැමිණ ඇත්තේ ජාතීන් අතර පවතින සහයෝගීතාව හේතු කොට ගෙන වේ. එම නිසා වර්තමානයේ ජාත්‍යන්තර සම්බන්ධතා ඉතා වැදගත් මාතෘකාවක් බවට පත්ව ඇත.


ජාත්‍යන්තර සම්බන්ධතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි නිර්වචන කිහිපයක් ඇසුරින් හඳුනා ගනිමු

**ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ව ඉදිරිපත් ව ඇති නිර්වචන**

I. "ජාත්‍යන්තර සබඳතා යනු ජාතීන් අතර පවත්නා වූ සියලු ම ආකාරයේ සබඳතාවන් ය."

II. රාජ්‍යයන්හි බලයලත් නැතහොත් අවසරලත් නිලධාරීන් විසින් පවත්වන්නා වූ රාජ්‍ය මට්ටමේ සබඳතාවකි.

ඒ අනුව ජාත්‍යන්තර සම්බන්ධතා යනුවෙන් අදහස් කරන්නේ රාජ්‍යයන් දෙකක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් අතර නැතිනම් රාජ්‍ය හා ජාත්‍යන්තර සංවිධාන අතර හෝ රාජ්‍ය හා පුද්ගලයන් අතර ඇති වන්නා වූ ඕනෑ ම ආකාරයක සම්බන්ධතා වේ. පහත රූප සටහන ඇසුරින් තවදුරටත් ඔබට ඒ පිළිබඳව අවබෝධ කර ගත හැකිය.




5.1 රූප සටහන

## ජාත්‍යන්තර සම්බන්ධතාවල වැදගත්කම

ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු කිහිපයක් වේ.

ඒවා නම්,

(1) තම රාජ්‍යයට තනිව සපුරා ගත නොහැකි යම් දෙයක් වේ නම් ඒවා සපුරා ගැනීම

මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීමත් සමග තම අවශ්‍යතා සපුරා ගැනීමට රාජ්‍යන්ට නොහැකි විය. රටින් රටට සම්පත්වල ස්වභාවය විවිධ වීම හේතු කොට ගෙන නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවාවන් ද වෙනස් විය. එම නිසා තම රටට අතිරික්ත භාණ්ඩ වෙනත් රටකට අලෙවි කිරීම මෙන් ම තමන්ට හිඟ භාණ්ඩ වේ නම් ඒවා ආනයනය කර ගැනීම සඳහා ද සුදුසුම මාර්ගය රාජ්‍ය - රාජ්‍ය අතර පවතින සම්බන්ධතා වේ. ඒ බව අවබෝධ කරගත් ලෝක ප්‍රජාව ජාත්‍යන්තර සම්බන්ධතා ඇති කර ගැනීම කෙරෙහි නැඹුරු විය. එබැවින් තම රාජ්‍යයට තනි ව සපුරා ගත නොහැකි අවශ්‍යතා සපුරා ගත හැකි වීම ජාත්‍යන්තර සබඳතා ඇති කර ගැනීමේ ප්‍රධාන අරමුණකි.

(2) දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය ක්ෂේත්‍ර ඔස්සේ සබඳතා පුළුල් කර ගත හැකි වීම

ලෝකයේ ඇති රාජ්‍ය බොහොමයක් ගත් විට ඒ සෑම රාජ්‍යයක් ම දේශපාලන, ආර්ථික, සංස්කෘතික සහ සමාජීය ලක්ෂණ අතින් වෙනස් වේ. එලෙස වෙනස්කම් පැවතීමෙහි යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල ද වන අතර එවැනි යහපත් ප්‍රතිඵල තවදුරටත් සංවර්ධනය කර ගැනීම සඳහා ජාත්‍යන්තර සම්බන්ධතා ඇතිකර ගැනීම වැදගත් වේ. නිදසුනක් ලෙස ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර බුදු දහම පදනම් කොට ගත් සංස්කෘතික සම්බන්ධතා මත මීට අවුරුදු දහස් ගණනකට පෙර සිට සම්බන්ධතා වර්ධනය වීම පෙන්වා දිය හැකි ය.

ලොව බොහෝ රාජ්‍යයන් මේ ආකාරයෙන් දේශපාලනික, ආර්ථික, සංස්කෘතික, හා සමාජීය සාධක පදනම් කර ගනිමින් සම්බන්ධතා ගොඩනගා ගෙන ඇත. එලෙස අතීතයේ ගොඩනගා ගත් සම්බන්ධතා වර්තමානය දක්වා ම ක්‍රමික ව වර්ධනය වන අතර එය දෙරට අතර පුළුල් අන්‍යෝන්‍ය මිත්‍රත්වයක් මෙන් ම සහයෝගයක් ගොඩනැඟීමට ඉවහල් වේ.

(3) ප්‍රබල රාජ්‍යවලින් ඇති කරන බලපෑම්වලින් ආරක්ෂා වීම සඳහා

වර්තමානයේ ලොව බොහෝ රාජ්‍යය ආර්ථික, යුද්ධමය ශක්තිය වැනි භෞතික සාධක පදනම් කොට ගෙන බලවත් තත්ත්වයට පත් ව ඇත. ඉහළ ආර්ථික ශක්තියක් මෙන් ම යුදමය වශයෙන් ප්‍රබලත්වයක් හිමි රාජ්‍ය ඊට සාපේක්ෂ ව ශක්තිමත් බවින් අඩු රටවල් සඳහා විවිධ බලපෑම් එල්ල කරනු ලැබේ. මෙම තත්ත්වය වර්ධනය වීම යටත් විජිත නිදහස ලැබීමත් සමග සිදු විය. දේශපාලන වශයෙන් විවිධ බලපෑම් කිරීම, ණය හා ආධාර දීම හරහා තම රටට අවනත කර ගැනීමට උත්සාහ දැරීම, අභ්‍යන්තර යුද්ධ සඳහා

අවි ආයුධ හා වෙනත් ආධාර සැපයීම වැනි ක්‍රම තුළින් බලපෑම් සිදු කරනු ලැබේ. ප්‍රබල රාජ්‍යයන් විසින් දුබල රාජ්‍යයන් වෙත එල්ල කරනු ලබන බලපෑම්වලින් යම්තාක් දුරකට හෝ ආරක්ෂා වීම සඳහා ජාත්‍යන්තර සබඳතාවන් වර්ධනය කර ගෙන සිටීම ඉවහල් වනු ඇත. එසේ නොවුණහොත් අන්තර්ජාතික සමාජය තුළ එකී දුබල රාජ්‍යයන් ප්‍රබල රාජ්‍යයේ ගොදුරක් බවට පත් විය හැකි ය.

(4) ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවලින් ඇති වන බාධා මඟ හරවා ගැනීම සඳහා

ලොව බොහෝ රාජ්‍යයන් තම ආර්ථික කටයුතු පවත්වා ගෙන යාම සඳහා ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබේ. නිදසුනක් ලෙස ඇඟලුම් කෝටා මිල දී ගැනීම, විවිධ ගිවිසුම් ඇතිකර ගැනීම මගින් භාණ්ඩ සඳහා සහතික මිලක් නියම කිරීම ආදිය පෙන්වා දිය හැකි ය.

**ක්‍රියාකාරකම්**

- ජාත්‍යන්තර සම්බන්ධතා යන්න කෙටියෙන් හඳුන්වා එහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

## ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප

ජාත්‍යන්තර සබඳතා යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න මෙන් ම එහි වැදගත්කම පිළිබඳ ව ඔබ මේ වන විට අවබෝධ කරගෙන තිබේ.

මීළඟට ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූපයන් කවරේ ද යන්න පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් වේ. මින් අදහස් කරන්නේ ජාත්‍යන්තර සම්බන්ධතා කවර ආකාරයකින් පවත්වනු ලබන්නේ ද යන්න වේ. එලෙස සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ආකාර දෙකක් හඳුනා ගත හැකි ය. එනම්,

1. රාජ්‍ය උපාය සම්බන්ධතා
2. යුද උපාය සම්බන්ධතා

### රාජ්‍ය උපාය සම්බන්ධතා

රාජ්‍ය සහ රාජ්‍ය අතර ඇති කර ගනු ලබන සාමකාමී සම්බන්ධතා රාජ්‍ය උපාය සම්බන්ධතා ලෙස හැඳින්විය හැකි ය. නැතිනම් තානාපතිවරු, මහ කොමසාරිස්වරු, රාජ්‍ය දූතයන් ආදී නිල මට්ටමේ පුද්ගලයින් හරහා ගොඩනඟා ගනු ලබන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවන් රාජ්‍ය උපාය සම්බන්ධතා ලෙස සැලකිය හැකි ය. මෙම රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනැගීම සඳහා මඟ පෙන්වනු ලබන්නේ තම රටේ විදේශ ප්‍රතිපත්තිය යි. තම රට කවර රාජ්‍ය සමඟ රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනඟා ගන්නේ ද, ඒ කවරාකාරයෙන් ද යන්න විදේශ ප්‍රතිපත්තිය තුළින් පෙන්නුම් කරයි. විශේෂයෙන් ම ජාත්‍යන්තර සමුළු, කලාපීය සංවිධාන, ද්වි පාර්ශ්වික රාජ්‍ය නායක හමුවීම්, විශේෂ දූතයින් හරහා අදහස් හුවමාරු කරගැනීම හා විදේශ ඇමතිවරු හරහා රාජ්‍ය උපාය සම්බන්ධතා ශක්තිමත් කර ගනු ලැබේ.

## යුද උපාය සම්බන්ධතා

යුදමය වශයෙන් රාජ්‍ය අතර ගොඩනඟා ගන්නා වූ සම්බන්ධතා යුද්ධ උපාය සම්බන්ධතා ලෙස හැඳින්විය හැකි ය. යම් රාජ්‍යයක් වෙත වෙනත් බාහිර රාජ්‍යයකින් යුදමය තර්ජනයක් පවතින අවස්ථාවල දී තම ආරක්ෂාව තහවුරු කර ගැනීම වෙනුවෙන් යුද උපාය සම්බන්ධතා ගොඩනඟා ගනු ලැබේ. පළමු හා දෙවන ලෝක යුද්ධ අවස්ථාවන්වලට පෙර රාජ්‍ය විසින් ගොඩනඟා ගත් බල කඳවුරු නිදසුන් ලෙස පෙන්වා දිය හැකි ය.

යුද උපාය සම්බන්ධතා මඟින් යුද පුහුණුව හා ඊට අවශ්‍ය විශේෂඥ සහය ලබා දීම, අවි ආයුධ සැපයීම, හමුදා ශක්තිය යෙදවීම මෙන් ම වෙනත් මානුෂීය ආධාර (ඖෂධ වැනි) ලබා දීම සිදු කරනු ලැබේ. ලොව රාජ්‍ය අතර බල සමතුලිතතාව පවත්වා ගෙන යාම කෙරෙහි යුද උපාය සබඳතා වැදගත් වේ. මන්ද එමඟින් එක් රටක් හෝ රටවල් කිහිපයක් විසින් තියුණු ලෙස යුදමය ශක්තිය පුළුල් කර ගනිමින් අනෙකුත් රාජ්‍යයන්ට තර්ජනයක් වීමේ ප්‍රවණතාව මෙමඟින් ගිලිහී යන හෙයිනි.

## ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වී ඇති විවිධ ක්ෂේත්‍ර

ඈත අතීතයේ ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වුව ද එය බොහෝ දුරට ක්ෂේත්‍ර කිහිපයකට පමණක් සීමා විය. විශේෂයෙන් ම වෙළඳාම හා සංස්කෘතික සාධක පදනම් කොට ගනිමින් එම සබඳතා ඇති වී තිබෙන ආකාරය හඳුනා ගත හැකි ය. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සංස්කෘතික කරුණු පදනම් කොට ගත් සබඳතාවයන් ද ශ්‍රී ලංකාව හා අරාබිය අතර වෙළඳාම මුල් කර ගත් සබඳතාවන් ද නිදසුන් ලෙස පෙන්වා දිය හැකි ය.

නමුත් මෙම සම්බන්ධතා වර්තමානය වන විට විවිධ ක්ෂේත්‍ර කරා පැතිර ගොස් ඇති ආකාරය හඳුනා ගත හැකි ය. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා, තාක්ෂණික සබඳතා සහ අධ්‍යාපනික සබඳතා ඉන් කිහිපයකි.

නූතන විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව සමඟ ම සන්නිවේදන හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන විප්ලවීය වෙනස හේතු කොට ගෙන ලොව එක ම විශ්ව ගම්මානයක් බවට පත් ව ඇත. අධිවේගී ගුවන් හා ජෙට් යානා මෙන් ම ගොඩබිම් මාර්ග හා ප්‍රවාහන පද්ධතියේ වර්ධනය ද එයට උපකාර වී ඇත. එසේ ම අන්තර්ජාලය හරහා පොත් , ජර්නල් ආදිය කියවීම (E - Library) වැනි පහසුකම් ඔස්සේ ජාත්‍යන්තර සම්බන්ධතා තවදුරටත් ශීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් ලෙස විශ්ව ගම්මානය තවදුරටත් හැකිලී යන ස්වරූපයක් වර්තමානයේ උදා වෙමින් තිබේ.



5.1 රූපය - අධිවේගී ගුවන්යානා




5.2 රූපය - අධිවේගී දුම්රිය

## ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමෙහි ලා බලපෑ සාධක

ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධන වී ඇති ක්ෂේත්‍ර කවරේ ද යන්න පිළිබඳ ව මේ වන විට ඔබ හොඳින් අවබෝධ කර ගෙන ඇතැයි සිතමු. ඒ අනුව ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම කෙරෙහි බලපා ඇති හේතු සාධක කවරේ ද යන්න පිළිබඳ ව මීළඟට විමසා බලමු.

- **සම්පත් විසංතුලනය හෙවත් එක් එක් රටවල පවතින සම්පත්වල වෙනස්කම්**
  උදා : ඛණිජ තෙල් සම්පත මැද පෙරදිග රටවල බහුල ව ව්‍යාප්ත ව පැවතිය ද ලොව අනෙකුත් රටවලට නොමැති වීම.
- **අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම.**

  උදා : ශ්‍රී ලංකාව තිරිඟු පිටි, සීනි වැනි දේ ආනයනය කිරීම

තම රටේ ජනතාව සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා සේවා සියල්ල එම රට තුළ නිපදවා ගත නොහැකි වීම වර්තමානයේ සෑම රටක් ම මුහුණ දෙනු ලබන ප්‍රමුඛ ගැටලුවක් වේ. එම නිසා වෙනත් රටක් මත යැපීමට සෑම විට ම සිදුවන හෙයින් එතුළින් ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමට සිදු වනු ඇත.

- **අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම**

තම රටේ පවතින සම්පත් උපයෝගී කර ගනිමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන විට එය බොහෝ දුරට තම රටට අතිරික්ත විය හැකි ය. එලෙස අතිරික්ත වූ විට එම අතිරික්ත ප්‍රමාණය එම භාණ්ඩය හිඟ වෙනත් රටකට අලෙවි කිරීමට යොමු වේ. එසේ අතිරික්තය අලෙවි කර ගැනීමට යොමු වීම තුළින් ද ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වේ.

- **ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව**

වර්තමානයේ ශීඝ්‍ර දියුණුවක් ඇති වූ ක්ෂේත්‍ර දෙකක් ලෙස ප්‍රවාහනය හා සන්නිවේදනය හඳුන්වා දිය හැකි ය. එහි ප්‍රතිඵලයක් ලෙස ලොව විශ්ව ගම්මානයක් බවට පත් ව ඇති අතර ම ජාත්‍යන්තර සම්බන්ධතා එමඟින් වර්ධනය විය. ක්ෂණික ව මෙන් ම පහසුවෙන් ගමන් පහසුව සලසා ගත හැකි වීම ද කඩිනමින් තොරතුරු හුවමාරු කර ගැනීම ද ජාත්‍යන්තර සබඳතා වර්ධනයට හේතු විය.

- **දියුණු තාක්ෂණය ලබා ගැනීමේ අවශ්‍යතාව**

විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමඟ ලොව බොහෝ රාජ්‍යයන් එහි ප්‍රතිලාභ අත්කර ගනු ලැබී ය. සමහර රටවල් කරා තාක්ෂණික දියුණුව ගමන් කර ඇත්තේ මන්දගාමී ස්වරූපයෙන් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධිත රටවල් හා ඌන සංවර්ධිත රටවල් ලෙස රටවල් අතර පරතරයක් ඇති වුණි. ඌන සංවර්ධිත රටවල තාක්ෂණික දියුණුව සංවර්ධිත රටවලට සාපේක්ෂ ව අවම මට්ටමක් විය. එමඟින් ඔවුනට දියුණු ශිල්පීය ක්‍රමවල හිඟකමක් ඇති වුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දියුණු සහ සංවර්ධිත රටවල නව තාක්ෂණික සොයා ගැනීම්, උපකරණ, විශේෂඥ සහාය සහ දැනුම ආදිය ඌන සංවර්ධිත රටවල් වෙත ලබා ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු විය. එතුළින් ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය විය.

- **හදිසි ආපද හා වෙනත් විපත් අවස්ථාවල දී සහාය ලබා ගැනීම**

හදිසි ආපද හෝ විපත් තත්ත්වයක් ඇති වූ විට ක්ෂණික සහාය ලබා ගැනීමට ලොව ඕනෑ ම රටකට සිදුවේ.

උදා : සුනාමි, සුළිසුළං, ගංවතුර, නාය යෑම්, ගිනි කඳු පිපිරීම්.

එවැනි අවස්ථාවල දී හදිසි මානුෂීය සහන සැපයීම සඳහා රාජ්‍යයන් ඉදිරිපත් වන්නේ ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගෙන ඇත්නම් පමණි.

- **දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික සබඳතා වැඩි දියුණු කර ගැනීම**

රාජ්‍යයන් විසින් අනුගමනය කරනු ලබන විවිධ දේශපාලන මතවාද, ආර්ථික ප්‍රතිපත්ති, සමාජීය හා සංස්කෘතික සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම සඳහා ජාත්‍යන්තර සම්බන්ධතා වැදගත් වේ. මේ යටතේ රාජ්‍යයන් අතර මිත්‍රත්වය වර්ධනය වන්නා සේ ම විදේශ ආධාර, ණය වැනි උපකාර සේවා සැපයීමටත්, සමාජීය සංවර්ධනය වෙනුවෙන් විවිධ උපකරණ හා සේවා සිදු කිරීමටත් පෙලඹේ. එමෙන් ම දේශපාලන වශයෙන් ප්‍රශස්ත මට්ටමක් කරා ගමන් කිරීමට අවශ්‍ය පෙලඹවීම මෙන් ම මඟ පෙන්වීම ද සිදු කරයි. යම් යම් අවස්ථාවන් හි දී දේශපාලන අයිතීන් හා මතවාද ආරක්ෂා කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර ව පෙනී සිටීම ද සිදු කරනු ලබයි.

## ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූපය

අතීතයේ දී ජාත්‍යන්තර සබඳතා පවත්වා ඇත්තේ සීමිත අරමුණු ප්‍රමාණයක් සපුරා ගැනීම සඳහා වන බව පෙනී යයි. එහෙත් වර්තමානයේ එම ජාත්‍යන්තර සබඳතා පුළුල් අරමුණු සමුදයක් පෙරදැරි කොට ගෙන බිහි වී තිබේ.

ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූය දෙස බලන කල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ප්‍රබල රාජ්‍ය විසින් දුබල රාජ්‍ය වෙත විවිධාකාරයෙන් බලපෑම් කරනු ලැබීමයි. ආර්ථික, දේශපාලන, යුධමය ශක්තිය හා තාක්ෂණික ඥානය ද යොදා ගෙන බලවත් රටවල් විසින් දුබල රටවල් වෙත බලපෑම් එල්ල කිරීම කැපී පෙනෙයි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු බල කඳවුරු වාදය බිඳ වැටීම නිසා සෑම රාජ්‍යයකට ම තම විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථ ව ගෙන යා හැකි පරිසරයක් නිර්මාණය වී තිබුණි. එවැනි පසුබිමක් තුළ වුව ද විවිධ ක්ෂේත්‍ර ඔස්සේ බලවත් රාජ්‍ය විසින් බලයෙන් අඩු රාජ්‍ය වෙත බලපෑම් එල්ල කරන බව පෙනී යයි. එවැනි බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ.

- අන්තර්ජාතික වෙළඳාම
- ණය හා ආධාර දීම
- ආර්ථික සංවර්ධනය
- ආරක්ෂක ක්ෂේත්‍රය
- රැකියා සැපයීම

ඉහත දක්වන ලද ක්ෂේත්‍ර යටතේ ජාත්‍යන්තර ප්‍රජාව විසින් ශ්‍රී ලංකාව වෙත එල්ල කරන ලද බලපෑම මීළඟට විමසා බලමු.

## ජාත්‍යන්තර සබඳතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම

ජාත්‍යන්තර සබඳතාවල වර්තමාන ස්වරූපය දෙස බලන විට පෙනී යන්නේ ප්‍රබල රාජ්‍යයන් විසින් දුබල රාජ්‍යයන් වෙත බලපෑම් එල්ල කරන ස්වරූපයක් වේ. ඒවා ආර්ථික, දේශපාලන, යුධමය ආදී විවිධ ක්ෂේත්‍රයන් යටතේ හඳුනා ගත හැකි ය.

විශේෂයෙන් ම ශ්‍රී ලංකාව කෙරෙහි එල්ල කරන බලපෑම් ඒකාකාරී ස්වරූපයක් නොගනියි. බලයේ සිටින ආණ්ඩුවේ ස්වභාවය අනුව ජාත්‍යන්තර ප්‍රජාව විසින් එල්ල කරන බලපෑමේ ස්වභාවය ද වෙනස් වේ. පොදුවේ ගත් විට පහත දැක්වෙන ක්ෂේත්‍ර ආශ්‍රිත ව ශ්‍රී ලංකාව කෙරෙහි එල්ල කරන ලද බලපෑම් කෙටියෙන් මෙහි දී සාකච්ඡා කෙරේ.

## ජාත්‍යන්තර වෙළඳාම

ශ්‍රී ලංකාව විසින් අපනයනය සිදු කරනු ලබන ප්‍රාථමික නිෂ්පාදන කෙරෙහි ලෝක වෙළඳපොලේ අඩු මිලක් පැවතීම හේතුවෙන් ආනයන ආදායම් අඩු මට්ටමක පවතී. එසේ ම සමහර දියුණු රටවල් විසින් ශ්‍රී ලංකාවේ ඇතැම් නිෂ්පාදන මිල දී ගෙන ප්‍රතිඅපනයනය කිරීම හේතුවෙන් අප රටට ලැබිය යුතු විශාල විදේශ විනිමය ප්‍රමාණයක් නොලැබී යයි.

මේ නිසා ජාත්‍යන්තර ප්‍රජාව සමඟ විවිධ වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීම තුළින් අපනයන වෙනුවෙන් ස්ථාවර මිලක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව කටයුතු කර ඇත. එසේම ඇඟලුම් අපනයනය කිරීමේ දී ඇමරිකානු ගැනුම්කරුවන් වෙත ඒවා ලබා දීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබේ.

එහෙත් පසුගිය කාල සීමාව තුළ සමහර වෙළඳ ගිවිසුම් අහෝසි කිරීම හරහා ශ්‍රී ලංකාව කෙරෙහි ජාත්‍යන්තර වෙළඳාම තුළින් යම් බලපෑමක් එල්ල විය.

උදා : **GSP** සහනය අහෝසි කිරීම

### ණය හා ආධාර ලබා දීම

ණය සහ ආධාර ලබා දීම තුළ ශ්‍රී ලංකාව සඳහා රාජ්‍ය විසින් බලපෑම් එල්ල කර තිබේ. නිදසුන් ලෙස ණය සහ ආධාර නිකුත් කිරීමේ දී විවිධ කොන්දේසි මත ඒවා ලබා දීම පෙන්වා දිය හැකි ය. මෙවැනි කොන්දේසි පැනවීම ප්‍රබල රාජ්‍ය විසින් පමණක් නොව ණය සහ ආධාර සපයනු ලබන විවිධ මූල්‍ය ආයතන විසින් ද සිදු කරනු ලැබේ.

උදා : ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

එවැනි ආයතන විසින් පනවනු ලබන කොන්දේසි කිහිපයක් පහත දැක්වේ.

- නම් කරන ලද ව්‍යාපෘතිය සඳහා පමණක් අදාළ ණය හා ආධාර යෙදවීම
- ණය පොලිය, වාරික ගෙවීම සඳහා කෙටි කාල සීමාවක් ලබා දීම
- ණය සහ ආධාර සපයන රටේ භෞතික/මානව සම්පත් අදාළ ව්‍යාපෘති සඳහා යොදා ගැනීම

## ආර්ථික ක්ෂේත්‍රය

ආර්ථික කටයුතු මෙහෙයවීමේ දී ශ්‍රී ලංකාව යම් යම් කාල සීමා තුළ ප්‍රබල ගැටලු සහගත තත්ත්වයකට පත් ව ඇත. ඇඟළුම් කෝටා ක්‍රමය අහෝසි කිරීම, ඛනිජ තෙල්වල මිල ඉහළ යාම වැනි අවස්ථා මෙහි දී කැපී පෙනෙයි. එවැනි තත්ත්වයක් තුළ ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර ව පවත්වා ගෙන යාම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට සිදු ව ඇත.
උදා : ණය හා ආධාර වැඩි වශයෙන් ලබා ගැනීම, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම, බැංකු පොලී ඉහළ දැමීම.

එවැනි අවස්ථාවල ආර්ථිකය ස්ථාවර ව පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, මහා භාණ්ඩාගාරය වැනි රාජ්‍ය මූල්‍ය හා සම්බන්ධ ආයතන විවිධ ක්‍රියා මාර්ග ගනු ලැබේ.

## ජාතික ආරක්ෂාව

රටක ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යාම පිණිස අදාළ රට විසින් විශාල පරිශ්‍රමයක් දරනු ලැබේ. විශේෂයෙන් පසුගිය කාල සීමාව තුළ පැවති යුද්ධමය තත්ත්වය තුළ ජාතික ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විශාල පරිශ්‍රමයක් දරනු ලැබීය. දියුණු තාක්ෂණික දැනුම, උපකරණ, විශේෂඥ සහාය ආදිය ප්‍රබල රාජ්‍ය වෙතින් ලබා ගැනීමට සිදුව තිබේ. එහි දී ත්‍රස්තවාදී කණ්ඩායම් වෙනුවෙන් රහසිගත ව අවි සැපයීම, ශ්‍රී ලංකා රජය වෙත ඉහළ මිලක් යටතේ අවි අලෙවි කිරීම, යුධ විශේෂඥ දැනුම ලබා නොදීම ආදිය හේතු කොට ගෙන ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යාම අභියෝගයට ලක් විය. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම අභ්‍යන්තර ව මෙන් ම බාහිර ව සිදු කළ යුතු වන අතර ඒ සඳහා ත්‍රිවිධ හමුදාව හා පොලීසිය සීරුවෙන් තැබීම කළ යුතු ය.

## රැකියා සැපයීම

ශ්‍රී ලංකාව සඳහා රැකියා වෙළඳපොලක් නිර්මාණය කර දීම සම්බන්ධයෙන් මැද පෙරදිග හා දකුණු කොරියාවට විශේෂ තැනක් හිමි වේ. එමගින් රටට විදේශ විනිමය විශාල වශයෙන් උත්පාදනය වන අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා ප්‍රබල දායකත්වයක් සපයනු ලබයි.

එහෙත් රැකියා වෙළඳපොල සඳහා ශ්‍රමිකයින් ලබා ගැනීමේ දී රැකියා ප්‍රමාණය සීමා කිරීම, යම් යම් රැකියා සඳහා අවම සුදුසුකම් නියම කිරීම, උපයන මුදල් ශ්‍රී ලංකාවට එවීම පිළිබඳ ව කොන්දේසි පැනවීම, ශ්‍රමිකයින් සඳහා දරුණු වධ හිංසා හා පීඩා ඇති කිරීම ආදිය තුළ සමහර රාජ්‍ය ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කර තිබේ. එහෙත් බොහෝ රාජ්‍ය ඉතා යහපත් මිත්‍ර සම්බන්ධතා ගොඩනගා ගනිමින් රැකියා වෙළඳපොල නිර්මාණය කර තිබේ.

## කලාපීය සංවිධාන

ජාත්‍යන්තර සංවිධාන පිළිබඳ සාකච්ඡා කරන විට තවත් එවැනි ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සංවිධාන උප විශේෂයක් වෙත අවධානය යොමු කළ යුතු ය. ලෝකයේ දක්නට ලැබෙන භූගෝලීය කලාප පදනම් කොට ගෙන මෙම කලාපීය සංවිධාන බිහි වී තිබේ.

එක් එක් භූගෝලීය කලාපය තුළ තවත් උපකලාප ද පවතී. නිදසුනක් ලෙස ආසියානු භූගෝලීය කලාපය තුළ දකුණු ආසියානු උපභූගෝලීය කලාපය දැක්විය හැකි ය. එවැනි උප කලාප තුළ ද ප්‍රාදේශීය සංවිධාන පිහිටුවා ගෙන ඇත. ඒවා ද කලාපීය සංවිධාන යන පොදු නමින් හඳුන්වනු ලබයි.

කලාපීය සංවිධාන බිහි වී ඇති ආකාරය දෙස අවධානය යොමු කරන විට පෙනී යන්නේ ප්‍රධාන අරමුණු දෙකක් පදනම් කරගෙන ඒවා ගොඩනැගී ඇති බවයි. එනම්,

- යුදමය අරමුණු පෙරදැරි කොට ගත් කලාපීය සංවිධාන
- ආර්ථික සහයෝගීතාව අරමුණු කොට ගත් කලාපීය සංවිධාන යනුවෙනි.

මීළඟට යුදමය අරමුණු මත ගොඩනඟා ගත් කලාපීය සංවිධාන පිළිබඳ ව සාකච්ඡා කරමු.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ලොව රාජ්‍යයන් බොහොමයක් ප්‍රධාන බල කඳවුරු දෙකක් වටා ඒකරාශී විය. එනම් ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර බල කඳවුර සහ සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර බල කඳවුර වශයෙනි.

මෙම බල කඳවුරු දෙක පදනම් කොට ගනිමින් යුදමය අරමුණු මත කලාපීය සංවිධාන බිහි වීම සිදු විය. ඒ අනුව ප්‍රථම කලාපීය යුදමය සංවිධානය වන්නේ උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (North Atlantic Treaty Organization - NATO) හෙවත් "නේටෝ"වයි.

නේටෝ සංවිධානය බිහි කර ගැනීම සඳහා බලපෑ මූලික කරුණ වන්නේ බටහිර යුරෝපා රටවල සාමූහික ආරක්ෂාව තහවුරු කර ගැනීම වේ.

ඉන් අනතුරුව නැගෙනහිර යුරෝපා රටවල ආරක්ෂාව වෙනුවෙන් සෝවියට් දේශය ප්‍රමුඛ රටවල් විසින් "වෝර්සෝ" ගිවිසුම් සංවිධානය (Warsaw Treaty Oragnization) පිහිටුවා ගනු ලැබීය. වෝර්සෝ සංවිධානය පිහිටුවා ගැනීමට මූලික වූයේ නේටෝ සංවිධානයෙන් එල්ල විය හැකි ආක්‍රමණයකට ප්‍රතිචාර දැක්වීම වේ. එහෙත් සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර යුරෝපා බල කඳවුර බිඳ වැටීමත් සමඟ වෝර්සෝ සංවිධානය අහෝසි වී ගිය අතර අද වන විට නේටෝව පමණක් ක්‍රියාත්මක වේ.

ආර්ථික අරමුණු මුල් කර ගනිමින් කලාපීය සංවිධාන බිහි වීමේ ප්‍රවණතාවක් මෑත කාලීන ව ලෝක දේශපාලනය තුළ දක්නට ලැබේ. ආර්ථික අරමුණු පදනම් කර ගනිමින් රාජ්‍ය, සංවිධාන ගත වීම බටහිර යුරෝපය තුළ පළමු ව ආරම්භ විය. 1957 දී ඇති කර ගන්නා ලද යුරෝපා ආර්ථික ප්‍රජාව (European Economic Community) පළමු ආර්ථික සහයෝගීතාව වෙනුවෙන් බිහි වූ කලාපීය සංවිධානය වේ. ඉන් අනතුරුව යුරෝපා හවුල, ලතින් ඇමරිකානු නිදහස් වෙළඳ සංගමය වැනි ඒවා බිහි විය.

ආසියානු කලාපය තුළ "ආසියාන්" (Association of South East Asian Nations) සංවිධානය 1967 දී පිහිටුවා ගත්හ. 1987 දී ආසියා හා ශාන්තිකර කලාපීය ආර්ථික සහයෝගීතා සංවිධානය (Asian Pacific Economic Co-operation Forum) බිහි කර ගනු ලැබීය. ආර්ථික හා සමාජ සංවර්ධනය වෙනුවෙන් දකුණු ආසියාතික රටවල් 1985 වර්ෂයේ


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

දී සාර්ක් සංවිධානය (South Asian Association for Regional Co-operation) පිහිටුවා ගනු ලැබී ය.

ඒ අනුව ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කර ගැනීම අරමුණු කොට ගනිමින් දකුණු ආසියානු උප භූගෝලීය කලාපයට අයත් රටවල් විසින් පිහිටුවා ගත් "සාර්ක්" සංවිධානය පිළිබඳ ව සාකච්ඡා කරමු.

## සාර්ක් සංවිධානය (SAARC)

දකුණු ආසියාතික කලාපයට අයත් රටවල් එක්ව පිහිටුවා ගත් සංවිධානය "සාර්ක්" (South Asian Association for Regional Co-operation) ලෙස හඳුන්වනු ලැබේ. දකුණු ආසියානු කලාපයට අයත් රටවල ආර්ථික සහයෝගීතාව වෙනුවෙන් "සාර්ක්" සංවිධානය පිහිටුවා ගනු ලැබී ය.

සාර්ක් සංවිධානයට අයත් රටවල් සංඛ්‍යාව අටක් වේ. පහත දැක්වෙන්නේ එම රටවල් දැක්වෙන සිතියමයි.

- ඉන්දියාව
- ශ්‍රී ලංකාව
- පාකිස්ථානය
- බංග්ලාදේශය
- නේපාලය
- භූතානය
- මාලදිවයින
- ඇෆ්ගනිස්ථානය




5.3 රූපය

මෙම රටවල් අතුරින් ඇෆ්ගනිස්ථානය හැර අනෙක් රටවල් හත සාර්ක් සංවිධානය ආරම්භ කරන අවස්ථාවේ පටන් ම සාමාජිකත්වය ලබා ගෙන තිබුණි. එහෙත් මෑත කාලයේ දී ඇෆ්ගනිස්ථානය ද ඊට එක්විය.

1985 දෙසැම්බර් මස 08 වන දින බංග්ලාදේශයේ ඩකා අගනුවර දී සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ සහභාගිත්වයෙන් සාර්ක් ප්‍රඥප්තියට අත්සන් තබනු ලැබී ය. බංග්ලාදේශයේ ඩකා නුවර දී සාර්ක් සංවිධානය පිහිටුවීමේ ප්‍රඥප්තිය සාමාජික රටවල

රාජ්‍ය නායකයින් අත්සන් තබනු ලබන්නේ එය පිහිටුවීමට මූලිකව කටයුතු කරමින් සිටින අතරතුර ජීවිතක්ෂයට පත් වූ හිටපු බංග්ලාදේශ ජනාධිපති සියා-උර්-රහමන් මැතිතුමා සිහිපත් කිරීමේ අරමුණෙනි.

පහත දැක්වෙන්නේ සාර්ක් සංවිධානයේ නිල ලාංඡනය වේ. එමගින් සාමාජික රාජ්‍යයන්හි සහයෝගීතාව නිරූපණය වේ.

SAARC

5.4 රූපය

පහත රූපය මඟින් සාර්ක් සංවිධානයේ සාමාජික රටවල ජාතික කොඩි නිරූපණය කෙරේ.




5.5 රූපය

## සාර්ක් සංවිධානයේ අරමුණු

- දකුණු ආසියානු කලාපයට අයත් ජනතාවගේ සුභසාධනය හා ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම
- කලාපීය ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධනය වේගවත් කිරීම
- සියලු ම පුරවැසියන්ට ගෞරවනීය ලෙස ජීවත්වීමට මෙන් ම හැකියාවන් වටහා ගැනීමට ඉඩ ප්‍රස්තා සැලසීම
- කලාපීය ජනතාව අතර සාමූහික ආත්ම විශ්වාසය වැඩි දියුණු කිරීම

- සාමාජික රටවල ප්‍රශ්න අවබෝධ කිරීම හා සලකා බැලීම සම්බන්ධ ව අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩනැංවීම
- ආර්ථික, සාමාජික, සංස්කෘතික හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල සහයෝගීතාව වැඩිදියුණු කිරීම හා ආධාර ලබා දීම
- වෙනත් රටවල් සමඟ සහයෝගීතාව වර්ධනය කිරීම
- පොදු වැදගත්කමකින් යුත් කරුණු සම්බන්ධයෙන් පැවැත්වෙන ජාත්‍යන්තර සමුළුවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාවෙන් කටයුතු කිරීම
- සමාන පරමාර්ථ හා අවශ්‍යතා පදනම් කොට ගෙන පවතින කලාපීය, ජාත්‍යන්තර සමුළුවල දී සහයෝගීතාවෙන් කටයුතු කිරීම.

## සාර්ක් සංවිධානයේ කාර්යභාරය

සාර්ක් සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින් වසරකට වරක් හෝ සාමාජික රටවල් අවශ්‍ය යැයි තීරණය කළ විට කිහිපවරක් හෝ රැස් වී සාකච්ඡා කළ යුතු බව ප්‍රඥප්තියේ දැක්වේ. රාජ්‍ය නායක සමුළුව මෙම සංවිධානයේ ඉහළ කමිටුව වේ. ඊට අමතර ව සාමාජික රාජ්‍යවල විදේශ ඇමතිවරුන්ගේ කමිටුව මෙන් ම විදේශ ලේකම්වරුන්ගේ කමිටු ද වේ. සාර්ක් සංවිධානයේ සෑම කාර්යයක් සම්බන්ධයෙන් ම අදාළ සංවිධාන කටයුතු සිදු කරනු ලබන ලේකම් කාර්යාලයක් වන අතර එය නේපාලයේ කත්මණ්ඩු නුවර පිහිටුවා ඇත.




සාර්ක් මහ ලේකම් කාර්යාලය



සාර්ක් රාජ්‍ය නායක සමුළුවක්

## සාර්ක් සංවිධානයේ වර්තමාන තත්ත්වය

වෙනත් ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සමඟ සලකා බලන විට සාර්ක් සංවිධානයේ සාමාජික රටවල් අතර සබඳතා එතරම් ශක්තිමත් බවක් නොපෙනේ. කෘෂිකාර්මික සංවර්ධනය, අපනයනය, සංස්කෘතික, ක්‍රීඩා, සෞඛ්‍ය, සුභසාධනය වැනි ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගැනීම සෑම රටකට ම අත්‍යවශ්‍ය වේ. ඊට ප්‍රධාන හේතුව සෑම සාමාජික රටක් ම පාහේ සංවර්ධනය වෙමින් පවතින රටවල් වීමයි. එසේ ම අභ්‍යන්තර දේශපාලන අර්බුද මෙන් ම යුදමය තත්ත්වයන් ද බොහෝ සාමාජික රටවලට පොදු ගැටලු වේ. මත්ද්‍රව්‍ය උවදුර හා ත්‍රස්තවාදී කණ්ඩායම් පාලනය කිරීම උදෙසා විශේෂ වෙහෙසක් දැරීමට සාමාජික රටවලට සිදු ව ඇත. ඉන්දියාව හා පාකිස්ථානය අතර පවතින රාජ්‍ය තාන්ත්‍රික විරසක බව සාර්ක් සංවිධානයේ ඉදිරි ගමනට අභියෝගයකි.

කලාපයේ සාමාජික රටවල් අතර නිදහස් වෙළඳපොලක් ඇති කර ගැනීම, තාක්ෂණික දැනුම හුවමාරුව හරහා නවීන ලෝකය හා සම්බන්ධ වීම, සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කර ගැනීම, පාරිසරික තිරසාර බව ආරක්ෂා කර ගැනීමට පියවර ගැනීම ආදිය සඳහා සාමාජික රටවල් ක්‍රියා කළ යුතු ය. එසේ ම ස්වාභාවික ආපද අවම කර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම, සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම ද අත්‍යවශ්‍ය වේ. බටහිර රටවල විවිධ බලපෑම්වලින් ආරක්ෂා වීම සඳහා තමන්ට සුවිශේෂ ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

සාර්ක් සාමාජික රටවල් අතර ඇති කර ගෙන ඇති වෙළඳ ගිවිසුම

1. SAPTA (දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම) - South Asian Preperential Trade Agreement
2. SAFTA (දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම) - South Asian Free Trade Agreement

## දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම (SAPTA)

අරමුණු :-

- කලාපීය වෙළඳාම සංවර්ධනය කිරීම
- සම්පත් කාර්යක්ෂම ව යෙදවීම
- දකුණු ආසියාවට සීමාවන වරණාත්මක වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- තීරු බදු සහන ලබා දීම

## දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

අරමුණු :-

- කලාපීය රටවල් අතර නිදහස් වෙළඳ කලාපයක් ඇති කිරීම
- කලාපීය රටවල ආර්ථික සහයෝගීතාව තර කිරීම

- එක් එක් රටවල දේශීය ආර්ථිකයේ වර්ධනය වේගවත් කිරීම
- කලාපීය රටවල නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම
- ශ්‍රම වෙළඳපොල ඉඩ ප්‍රස්තා පුළුල් කිරීම
- තරඟකාරිත්වය තුළින් වඩාත් ඉහළ මට්ටමේ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම

## සාර්ක් සංවිධානය වෙනත් ජාත්‍යන්තර සංවිධාන හා කලාපීය සංවිධාන සමඟ ඇති කර ගෙන ඇති සබඳතා

සාර්ක් සංවිධානය ලෝකයේ වෙනත් එවැනි කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සබඳතා ගොඩනගා ගෙන තිබේ. එම සබඳතා තුළින් කලාපීය හා ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීමේ අවස්ථාව උදා වේ. පහත දැක්වෙන්නේ එසේ සබඳතා ගොඩනගා ගෙන ඇති ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන කිහිපයකට නිදසුන් වේ.

සාර්ක් - උන්ක්ටාඩ් (UNCTAD)

සාර්ක් - යුනිසෙෆ් (UNICEF)

සාර්ක් - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

සාර්ක් - කොළඹ ක්‍රමය (COLOMBO PLAN)

## ආසියාන් සංවිධානය (ASEAN)

ආරම්භය :- 1967

මූලස්ථානය :- ඉන්දුනීසියාවේ ජකර්තා නුවර

සාමාජික රටවල් :- ඉන්දුනීසියාව, සිංගප්පූරුව, තායිලන්තය, පිලිපීනය, මැලේසියාව, වියට්නාමය, බෲනායි, මියන්මාරය, ලාඕසය

පරමාර්ථ :-

- සහයෝගීතාව මත ඒකාබද්ධ ආර්ථික ක්‍රමයක් සාමාජික රටවල ක්‍රියාත්මක කිරීම
- අන්‍යෝන්‍ය සහයෝගීතාව මත සහයෝගයෙන් පර්යේෂණාත්මක අංශ දියුණු කිරීම
- කෘෂිකාර්මික සහ කාර්මික ක්ෂේත්‍රයේ දී වඩාත් සඵලතාව සඳහා එක්සත් වීම
- සාමාජික රටවල වෙළඳ කටයුතු දියුණු කර ගන්නා අතර ම ජාත්‍යන්තර වාණිජ කටයුතුවල දී ඇති ප්‍රශ්න හැදෑරීමේ මාර්ග දියුණු කිරීම
- සාමාජික රටවල ජනජීවිතය උසස් කිරීම හා සන්නිවේදන මාර්ග දියුණු කිරීම

## කොළඹ ක්‍රමය (Colombo plan)

දකුණු හා අග්නිදිග ආසියාතික රටවල ආර්ථික හා සමාජයීය අභිවෘද්ධිය සඳහා ඇති කර ගන්නා ලද සාමුහික සැලැස්ම 'කොළඹ ක්‍රමය' ලෙස හඳුන්වයි. 1950 ජනවාරි මස කොළඹ දී පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය විදේශ ඇමතිවරුන්ගේ සම්මේලනයේ දී ඉදිරිපත් වූ යෝජනාවකට අනුව කොළඹ ක්‍රමය ආරම්භ විය. එවක ශ්‍රී ලංකාවේ මුදල් ඇමතිවරයා

වූ ජේ. ආර්. ජයවර්ධන මහතා හා ඕස්ට්‍රේලියානු නියෝජිත සර් පර්සි ස්පෙන්ඩර්ගේ මූලිකත්වයෙන් සංවිධානය ඇරඹුණි. පහත දැක්වෙන්නේ එම සංවිධානයේ ලාංඡනයයි.




පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල් 07ක සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් සංවිධානය ආරම්භ විය. පසුව රටවල් 27 දක්වා සාමාජිකත්වය වර්ධනය වී ඇත.

## කොළඹ ක්‍රමයේ සාමාජික රටවල්

- ශ්‍රී ලංකාව
- බ්‍රිතාන්‍ය
- කැනඩාව
- නවසීලන්තය
- ලාඕසය
- මියන්මාරය
- ජපානය
- මැලේසියාව
- මාලදිවයින
- පිජී දූපත්
- කොරියානු සමූහාණ්ඩුව
- ඕස්ට්‍රේලියාව
- පාකිස්ථානය
- ඇමෙරිකා එක්සත් ජනපදය
- නේපාලය
- පිලිපීනය
- සිංගප්පූරුව
- ඉරානය
- පැපුවා නිව්ගිනියාව
- ඇෆ්ගනිස්ථානය
- ඉන්දියාව
- කාම්බෝජය
- වියට්නාමය
- ඉන්දුනීසියාව
- තායිලන්තය
- භූතානය
- බංග්ලාදේශය

මෙම සංවිධානයේ සාමාජික රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතික ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන ආධාර සපයයි. කෘෂිකර්මය, සන්නිවේදනය, බලශක්තිය, අධ්‍යාපනය, සෞඛ්‍යය සේවා ආදී ක්ෂේත්‍ර සඳහා විශේෂඥ සේවා සැපයීම, පුහුණුවීම් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම, පර්යේෂණ උපකරණ සැපයීම ආදිය සිදු කරයි.

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා යන්ත්‍ර සූත්‍ර, වාහන, දුම්රිය එන්ජින්, කෘෂි උපකරණ, ධීවර ආම්පන්න, අධ්‍යාපන උපකරණ මෙන් ම කාර්මික ශිල්ප ඥනය, විශේෂඥයින් පුහුණු කිරීම, ශිෂ්‍යත්ව ප්‍රදනය කිරීම් ආදිය සිදු කර ඇත.

## බිම්ස්ටෙක් (BIMST-EC)

ආරම්භය :- 1988

මූලස්ථානය :- බංග්ලාදේශයේ ඩකා

සාමාජික රටවල් :-

| | |
|---|---|
| බංග්ලාදේශය | - B |
| ඉන්දියාව | - I |
| මියැන්මාරය | - M |
| ශ්‍රී ලංකාව | - S |
| තායිලන්තය | - T |

ආර්ථික සහයෝගීතාව - EC

නව සාමාජිකයින් දෙදෙනෙකු (2005) මෙම සංවිධානයට එක් විය. එනම් නේපාලය හා ඇෆ්ගනිස්ථානයයි.

අරමුණු :-

- සාමාජික රටවල ඒකාබද්ධ ආර්ථික සහයෝගීතාව සහ තාක්ෂණික දැනුම හුවමාරුව

## ජාත්‍යන්තර සංවිධාන

සමාජයේ ජීවත් වන අපට එදිනෙද තම කටයුතු පවත්වා ගෙන යාම සඳහා සෙසු අයගේ උදවු උපකාර මෙන් ම සහයෝගය අත්‍යවශ්‍ය වේ. ඒ පරිද්දෙන්ම ලොව රාජ්‍යයන් සඳහා ද තම කටයුතු හා අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සෙසු රටවල සහයෝගය හා උපකාරය අත්‍යවශ්‍ය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස රටවල් කිහිපයක් ඒකරාශී වී තම පොදු අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සම්මුතියක් හරහා එකඟතාවන් ගොඩනගා ගැනීම ජාත්‍යන්තර සංවිධාන බිහි වීමේ මූලාරම්භයයි.

ලොව බිහි ව ඇති ජාත්‍යන්තර සංවිධාන විශාල ප්‍රමාණයකි. එමගින් සෑම රටකට ම අන්‍යෝන්‍ය වශයෙන් විවිධ උපකාර හා අනුග්‍රහ ලැබේ. විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය (එක්සත් ජාතීන්) සෑම සාමාජික රටක් සඳහා ම විශාල මෙහෙයක් ඉටු කරනු ලබයි. මෙහි දී ඔබට එක්සත් ජාතීන් මෙන් ම ඊට අනුබද්ධ ආයතන කිහිපයක ක්‍රියාකාරිත්වය පිළිබඳ ව වටහා ගැනීමට අවස්ථාව උදා වේ.

## එක්සත් ජාතීන් (UNITED NATIONS)


දෙවන ලෝක යුද්ධය අවසන් වීමත් සමග නැවත එවැනි ලෝක යුද්ධයක් ඇති වීම වළක්වා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගනු ලැබී ය. විශේෂයෙන් ම

දෙවන ලෝක සංග්‍රාමය නිසා ලක්ෂ සංඛ්‍යාත මිනිස් ජීවිත සංඛ්‍යාවක් විනාශ වීමත්, අංගවිකල හා ආබාධිත තත්ත්වයට පත් වීමත් එමගින් සිදු විය. මිල කළ නොහැකි දේපල ප්‍රමාණයක් ද විනාශ විය. එම නිසා නැවත මෙවැනි ව්‍යසනකාරී තත්ත්වයන් කරා රාජ්‍යයන් ගමන් කිරීම වළකාලීම කෙරෙහි ලෝක නායකයන්ගේ අවධානය යොමු විය. ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය හා සෝවියට් දේශය යන එවක ප්‍රබල රාජ්‍යයන් මෙහි දී මූලික ව ක්‍රියා කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස 1945 දී රටවල් 50ක සහභාගිත්වයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ සැන් ප්‍රැන්සිස්කෝ නුවර දී අන්තර්ජාතික සංවිධානය පිහිටුවා ගැනීම සඳහා සමුළුවක් පැවැත්විය. 1945 ජුනි 26 එම රටවල් අත්සන් තැබීමෙන් පසු එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්මත කර ගත්හ.

## එක්සත් ජාතීන්ගේ අරමුණු

- ලෝක සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යාම
- ජාතීන් අතර සබඳතා වර්ධනය කිරීම
- අන්තර්ජාතික, ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා මානුෂවාදී ගැටලු නිරාකරණය කිරීමට සහාය වීම
- මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- මෙම පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ගනු ලබන පියවර එක්තැන් කොට ඒවා අතර සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාමේ මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීම

## එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහය




## මහා මණ්ඩලය

- එක්සත් ජාතීන්ගේ සියලු ම සාමාජිකයන්ගෙන් මහා මණ්ඩලය සමන්විත වේ.
- සෑම සාමාජිකයෙකුට ම එක් ඡන්දයක් බැගින් හිමි වේ.
- වර්ෂයකට වරක් රැස් වේ. එහෙත් සාමාජිකයින් වැඩිදෙනාගේ ඉල්ලීම මත විශේෂ රැස්වීම් පැවැත්විය හැකි ය.

## බලතල හා කාර්යය

- එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අදාළ ඕනෑ ම කරුණක් පිළිබඳ ව සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නිරායුධකරණය, අවි සීමා කිරීම පිළිබඳ ප්‍රතිපත්ති, අන්තර්ජාතික සාමය හා ආරක්ෂාවට අදාළ ප්‍රතිපත්ති විමර්ශනය කිරීම හා නිර්දේශ කිරීම.
- අන්තර්ජාතික සාමය හා ආරක්ෂාවට හානි පැමිණිය හැකි අවස්ථාවල දී එය ආරක්ෂක මණ්ඩලයේ විශේෂ අවධානයට යොමු කිරීම.
- ආරක්ෂක මණ්ඩලය හා සෙසු ආයතනවලින් ලැබෙන වාර්තා සලකා බැලීම.
- සංවිධානයේ අය-වැය ලේඛනය සැකසීම.
- ආරක්ෂක මණ්ඩලයට ස්ථාවර නොවන සාමාජිකයන් පත් කිරීම, ආර්ථික හා සමාජ කටයුතු පිළිබඳ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම, ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහ ලේකම් පත් කිරීම.

## ආරක්ෂක මණ්ඩලය

- මුළු සාමාජික රටවල් ගණන 15කි. ඉන් 05ක් ස්ථාවර සාමාජිකයන් වේ.
  - චීනය
  - ඇමරිකා එක්සත් ජනපදය
  - බ්‍රිතාන්‍ය
  - ප්‍රංශය
  - සෝවියට් රුසියාව
- වසර 02ක කාලයක් සඳහා මහා මණ්ඩලය විසින් ස්ථාවර නොවන සාමාජිකයෝ 10ක් පත් කරනු ලබයි.
- ස්ථාවර සාමාජිකයන් සියලු දෙනා ඇතුළු ව අවම සාමාජිකයන් 9 දෙනෙකුගේ එකඟතාවෙන් තීරණ ගනු ලබයි.
- තීරණ ගැනීම සම්බන්ධයෙන් නිෂේධ බලය හිමි වන්නේ ස්ථාවර සාමාජිකයන්ට පමණි.

## බලතල හා කාර්යය

- අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගෙන යාම
- අන්තර්ජාතික ගැටුමකට හේතු විය හැකි ඕනෑ ම ආරවුලක් පිළිබඳ පරීක්ෂා කිරීම
- එවැනි ආරවුල් සමථයකට පත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම
- ආක්‍රමණිකයෙකුට එරෙහි ව පියවර ගැනීම
- අවි පාලනය සඳහා සැලසුම් සම්පාදනය

## ආර්ථික හා සමාජ මණ්ඩලය

- සාමාජික සංඛ්‍යාව 54ක් වේ. එක් සාමාජික රටක නිල කාලය වසර 03කි. සෑම වසර 03ට වරක් සාමාජිකයන් 18ක් ඉවත් වන අතර ඒ සඳහා අලුතින් සාමාජිකයන් 18ක් පත් වේ.

## බලතල හා කාර්යය

- මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීම
- අන්තර්ජාතික වශයෙන් වැදගත් ආර්ථික හා සමාජයීය විෂය කරුණු සාකච්ඡා කිරීම
- සිය අධිකාරියට අදාළ වන අන්තර්ජාතික සමුළු පැවැත්වීම
- එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන සමග ගිවිසුම් පිළියෙළ කිරීම
- තමන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධානවල උපදෙස් විමසීම

## භාරකාර මණ්ඩලය

- භාරකාර ප්‍රදේශවල පරිපාලන සාමාජිකයන්, එම කාර්යයෙහි නොයෙදෙන ආරක්ෂක මණ්ඩල සාමාජිකයන්, මහා මණ්ඩලය විසින් තෝරා පත් කරන සාමාජිකයන් යන කණ්ඩායම් භාරකාර මණ්ඩලයේ සාමාජිකයෝ වෙති.
- ආරම්භයේ දී මෙයට භූමි ප්‍රදේශ 11ක් පැවරුන අතර වර්තමානයේ ඒ සියල්ල ස්වාධීන පාලන ප්‍රදේශ බවට පත් ව ඇත.

## බලතල හා කාර්යය

- භාරකාර ක්‍රමයට ගැනෙන භූමි ප්‍රදේශවල පරිපාලනය අධීක්ෂණය කිරීම.
- භාරකාර ප්‍රදේශවල ජනයාගේ අභිවෘද්ධිය සැලසීම.
- ස්වයං පාලනය හෝ ස්වාධීනත්වය වෙත ළඟා වීම සඳහා හුරු කරවීම.

## ජාත්‍යන්තර අධිකරණය

- එක්සත් ජාතීන්ගේ ප්‍රධානතම අධිකරණ ආයතනය වේ.
- සියලු ම සාමාජික රටවලට තම පැමිණිලි ජාත්‍යන්තර අධිකරණය වෙත යොමු කළ හැකි ය.
- යම් යම් නෛතික කරුණු ජාත්‍යන්තර අධිකරණය වෙත යොමු කිරීමේ බලය ආරක්ෂක මණ්ඩලය සතු වේ.
- මහා මණ්ඩලය හා ආරක්ෂක මණ්ඩලය විසින් පත් කරන විනිසුරුවන් 15 දෙනකුගෙන් සමන්විත වේ.
- ජාත්‍යන්තර අධිකරණයේ පෙනී සිටිය හැක්කේ රාජ්‍යයකට පමණි.

## බලතල හා කාර්යය

- එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඊට අනුබද්ධ ආයතනවලට අවශ්‍ය නීති උපදෙස් සැපයීම.
- සාමාජික රටවල් විසින් ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීම.
- සාමාජික රටවල් ඉදිරිපත් කරන පැමිණිලිවලට අදාළ විභාග සඳහා සහභාගී වන්නේ නම් ජාත්‍යන්තර අධිකරණය ලබා දෙන තීන්දුව පිළිගැනීම.

## ලේකම් කාර්යාලය

- එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන ආයතනය වේ.
- මෙහි ප්‍රධානියා වන්නේ මහ ලේකම්වරයායි. වසර 05ක නිල කාලයක් සඳහා මහා මණ්ඩලය විසින් පත් කරනු ලබයි. තනතුර දැරිය හැකි උපරිම වාර ගණන දෙකකි.
- අන්තර්ජාතික ආරක්ෂාවට මෙන් ම සාමයට තර්ජනයක් විය හැකි ඕනෑ ම කරුණක් ආරක්ෂක මණ්ඩලය වෙත යොමු කිරීම.
- කාර්යමණ්ඩලය පත් කරන්නේ මහ ලේකම් විසිනි.
- කාර්යමණ්ඩලය ක්‍රියා කළ යුත්තේ රට වෙනුවන් නොව එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙනුවෙනි.
- තානාපති සේවයට හිමි සියලු වරප්‍රසාද කාර්යමණ්ඩලයට හිමි ය.

## බලතල හා කාර්යය

- සංවිධානයේ වාර්ෂික වාර්තාව පිළියෙළ කොට ඉදිරිපත් කිරීම
- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුද පාලනය කිරීම
- අර්බුද නිරාකරණය සඳහා සාම දූතයෙකු වශයෙන් මැදිහත් වීම
- එක්සත් ජාතීන්ගේ විෂය කරුණුවලට අදළ ජාත්‍යන්තර සමුළු කැඳවීම
- ජනාවාස සේවාවන් පවත්වා ගෙන යාම

## එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන

එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ මණ්ඩලයට අනුබද්ධ රටවල ආර්ථික හා සමාජ සංවර්ධනය තුළින් මානව අයිතිවාසිකම් සුරැකීම අරමුණු කර ගෙන ක්‍රියාත්මක වන අනුබද්ධ ආයතන රාශියක් වේ. පහත දැක්වෙන්නේ ඉන් කිහිපයකි.

- ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
- අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO)
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)
- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO)
- ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව (IBRD/ලෝක බැංකුව)
- අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF)
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)

- ලෝක ආහාර වැඩසටහන (WFP)
- ලෝක සෞඛ්‍යය සංවිධානය (WHO)
- සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR)

## තෝරා ගත් අනුබද්ධ ආයතන කිහිපයක විස්තර

| අනුබද්ධ ආයතනය | අරමුණු | ලාංඡනය |
|---|---|---|
| UNESCO (එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය<br><br>ආරම්භය : 1945 | • සාමාජික රටවල අධ්‍යාපනය, සෞඛ්‍යය, ස්වාභාවික විද්‍යා, මානව විද්‍යා, සංස්කෘතික හා සන්නිවේදන යන අංශවල සංවර්ධනය<br><br>• අන්තර්ජාතික බුද්ධිය තුළින් සාමය ඇති කිරීම | |
| UNICEF (එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල)<br><br>ආරම්භය : 1946 | • ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා තහවුරු කිරීම<br><br>• පූර්ණ ළමා සංවර්ධනයක් ඇති කිරීම<br><br>• ළමා සංවර්ධනය සඳහා ඒ ඒ රටවල ආණ්ඩු, එක්සත් ජාතීන්ගේ වෙනත් ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන හා එක් ව කටයුතු කිරීම | |
| UNDP (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන)<br><br>ආරම්භය : 1965 | • සංවර්ධනය වන රටවල ආර්ථික හා සමාජ සංවර්ධනය කඩිනම් කිරීමට සහය වීම<br><br>• සංවර්ධනය වන රටවල ජාතික සංවර්ධන සැලසුම්වලට හා ප්‍රමුඛතාවලට අනුකූල ව තාක්ෂණික ආධාර සැපයීම<br><br>• ස්ව ශක්තිය සහ ධරණීය සංවර්ධනය තහවුරු කිරීම | |

| අනුබද්ධ ආයතනය | අරමුණු | ලාංඡනය |
|---|---|---|
| UNHCR (සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය)<br><br>ආරම්භය : 1950 | • සරණාගතයින් සඳහා අන්තර්ජාතික ආරක්ෂාව සැපයීම<br>• සරණාගතයින්ගේ ප්‍රශ්නවලට කල් පවත්නා විසඳුම් සෙවීම<br>• සරණාගතයින්ට මානුෂවාදී සහන සැලසීම<br>• සරණාගතයන් ඔවුන්ට පුරුදු ජන සමාජයට යළි ඒකාබද්ධ කොට නැවත සාමාන්‍ය දිවි පෙවෙත ආරම්භ කිරීමට උදව් කිරීම | |
| UNFPA (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල)<br><br>ආරම්භය : 1969 | • ජනගහනය විෂය ආශ්‍රිත ගැටලුවල දී සංවර්ධනය වන රටවලට සහය වීම<br>• සංවර්ධනය වන රටවල ජනගහන වැඩසටහන් සඳහා ආධාර සැපයීම<br>• සංවර්ධනය වන රටවල ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ක්‍රියා කිරීම | |
| WFP (ලෝක ආහාර වැඩසටහන)<br><br>ආරම්භය : 1963 | • සාගින්න හා දරිද්‍රතාව පිටු දැකීම<br>• සංවර්ධනය වන රටවල ආර්ථික හා සමාජ සංවර්ධනය තහවුරු කිරීම<br>• හදිසි ආපදාවලින් විපතට පත්වූවන්ට උදව් උපකාර කිරීම | |
| ILO (ලෝක කම්කරු සංවිධානය)<br><br>ආරම්භය : 1919<br><br>(එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතනයක් බවට 1946 දී පත් විය) | • කම්කරු ජනතාව සඳහා සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම<br>• කම්කරුවන්ගේ සේවා තත්ත්වය හා ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට උපකාරී වන අන්තර්ජාතික ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය | |

| අනුබද්ධ ආයතනය | අරමුණු | ලාංඡනය |
|---|---|---|
| FAO (ආහාර හා කෘෂිකර්ම සංවිධානය)<br><br>ආරම්භය : 1945 | • ග්‍රාමීය ජනතාවගේ පෝෂණ හා ජීවන මට්ටම ඉහළ නැංවීම<br><br>• කෘෂිකාර්මික ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා මැදිහත් වීම | |
| WHO (ලෝක සෞඛ්‍ය සංවිධානය)<br><br>ආරම්භය : 1948 | • සෑම කෙනෙකුටම හැකි ඉහළම සෞඛ්‍ය තත්ත්වය අත්කර දීමට උපකාර කිරීම<br><br>• රෝගාබාධවලින් තොර යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක් ප්‍රවර්ධනය කිරීම | |
| IBRD (ලෝක බැංකුව)<br><br>ආරම්භය : 1949 | • බැංකුවේ සාමාජික රටවල ජනයාට වඩා යහපත් ජීවිතයක් ගෙන යාම සඳහා එම රටවල ආර්ථික හා සමාජීය සංවර්ධනයට සහාය වීම (මෙහි ආරම්භක අරමුණ වූයේ II වන ලෝක යුද්ධයෙන් විනාශ වූ සාමාජික රටවල ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම) | |
| IMF (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල)<br><br>ආරම්භය : 1944 | • ජාත්‍යන්තර වශයෙන් මූල්‍ය පිළිබඳ ස්ථාවරත්වයක් හා විධිමත් විනිමය ක්‍රමයක් පවත්වා ගෙන යාම<br><br>• රටවල් අතර බහුපාර්ශ්වීය ගෙවීම් ක්‍රමයක් ඇති කර ගැනීම<br><br>• විදේශ වෙළඳාම පුළුල් කිරීම සඳහා සහ ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැපයීම | |

## පොදු රාජ්‍ය මණ්ඩලය (Common Wealth)

දෙවන ලෝක යුද්ධයේ අවසන් කාලය තුළ බ්‍රිතාන්‍ය යටත් විජිත බොහොමයකට නිදහස හිමි විය. එම නිදහස ලැබීමත් සමග එම රටවල් සමග පැවති සබඳතා තව දුරටත් පවත්වා ගෙන යාම සඳහා බ්‍රිතාන්‍යය පොදු රාජ්‍ය මණ්ඩලය නැමති සංවිධානය බිහි විය. මුල් යුගය තුළ ආසියා හා අප්‍රිකා කලාපවල රටවල් සාමාජිකත්වය ලබා ගැනීම හේතුවෙන් බ්‍රිතාන්‍ය යන නම ඉවත් වී "පොදු රාජ්‍ය මණ්ඩලය" ලෙස හඳුන්වනු ලැබී ය. 1911 දී මහා බ්‍රිතාන්‍ය විසින් තම අධිරාජ්‍යයට අයත් යටත් විජිතවලට පොදු ගැටලු සාකච්ඡා කිරීම සඳහ "අධිරාජ්‍ය සම්මේලනය" නමින් සමුළුවක් පවත්වනු ලැබී ය. පසුව යටත් විජිත වශයෙන් පැවති රටවල සාමාජිකත්වයෙන් පොදු රාජ්‍ය මණ්ඩලය ලෙස 1944 දී ආරම්භ විය.

එහෙත් පොදු රාජ්‍ය මණ්ඩලයේ උපත සඳහා 1839 පළ වූ ඩර්හැම් කොමිෂන් වාර්තාව බලපා ඇත. බ්‍රිතාන්‍ය යටත් විජිත වශයෙන් පැවති නිදහස දිනාගත් සෑම රටක් ම පොදු රාජය මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ගැනීම අනිවාර්ය නොවේ. පොදු රාජ්‍ය මණ්ඩලයේ නායකයා වන්නේ බ්‍රිතාන්‍ය රජු හෝ රැජිණයි.

ආරම්භක සාමාජිකයන් - 07

ආරම්භක සාමාජික රටවල් - මහා බ්‍රිතාන්‍යය/ඕස්ට්‍රේලියාව/ දකුණු අප්‍රිකාව/ සිම්බාබ්වේ කැනඩාව/ නවසීලන්තය/ ඉන්දියාව

අරමුණු :-

- මානව සංහතියේ ආරක්ෂාව හා අභිවෘද්ධිය සඳහා ඉවහල් වන අන්තර්ජාතික සාමය හා ස්ථාවරභාවය නගා සිටුවීම සඳහා කටයුතු කිරීම
- ජාති, වර්ග, ආගම් ආදී භේද නොතකා සියලු පුරවැසියන්ගේ පුද්ගල නිදහස හා සමාන අයිතිවාසිකම් වර්ධනය කරනු සඳහා කටයුතු කිරීම
- තමන් ජීවත්වන සමාජය සකස් කර ගැනීමට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන කටයුතුවල යෙදීම සඳහා සියලු දෙනාට ම ඇති අයිතිය සුරක්ෂිත කිරීම හා වර්ධනය කිරීම
- දිළිඳුකම, නූගත්කම හා ලෙඩ රෝග තුරන් කිරීම සඳහා කෙරෙන කටයුතු වැඩි දියුණු කිරීම සහ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා කටයුතු කිරීම
- යුද්ධවලට හේතුකාරක වන තත්ත්වයන් ඉවත් කරනු සඳහා අන්තර්ජාතික සහයෝගීතාව වර්ධනය කරමින් ඉවසීම ඇති කොට, අසාධාරණය තුරන් කර ලෝක ජාතීන් අතර ආරක්ෂාව වැඩි දියුණු කිරීම
- ජාති භේදවාදය හා යටත් විජිතවාදය හෙළා දකිමින් මිනිසාගේ අභිමානය හා සමාජ සමානත්වය වර්ධනය කිරීම

## ජාත්‍යන්තර සබඳතා මාධ්‍ය

ලොව රාජ්‍යයන් සම්බන්ධතා පවත්වා ගෙන යනු ලබන ආකාර විවිධ වේ. විශේෂයෙන් සාමකාමී සම්බන්ධතා මෙන් ම යුදමය සම්බන්ධතා ඔස්සේ මෙම ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගෙන ඇත.

සාමකාමී සම්බන්ධතා තුළ ජාත්‍යන්තර ප්‍රජාව කටයුතු කිරීම ඉතා යහපත් වේ. එවිට අන්‍යෝන්‍ය විශ්වාසය හා සහයෝගය වර්ධනය වනු ඇත. එතුළින් ගැටුම් අවම වේ.

ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන මාධ්‍ය කිහිපයක් පිළිබඳ ව මීළඟට සලකා බලමු.

1. තානාපති සේවය

රාජ්‍ය අතර සාමකාමී සම්බන්ධතා පවත්වා ගෙන යන ප්‍රධාන මාධ්‍ය තානාපති සේවය වේ. ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීම උදෙසා තානාපති සේවය සතු කාර්යභාරය අතිමහත් ය. රටක විදේශ ප්‍රතිපත්තිය ශක්තිමත් ව පවත්වා ගෙන යමින් තානාපති සේවය ජාත්‍යන්තර සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට කටයුතු කරයි.

එක් රාජ්‍යයක් තවත් රාජ්‍යයක් සමග මෙන් ම සංවිධාන හා පුද්ගලයින් සමග ද නිල සම්බන්ධතා ගොඩ නගා ගන්නේ තානාපති සේවය හරහා වේ. මෙහි දී තානාපතිවරු මෙන් ම රාජ දූතයන් හරහා රාජ්‍ය විසින් තම විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබයි.

පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල තානාපතිවරු "මහ කොමසාරිස්" යන විශේෂ නමකින් හඳුන්වයි. නිදසුන් ලෙස ශ්‍රී ලංකාවේ ඉන්දියානු තානාපතිවරයා හඳුන්වන්නේ "ඉන්දියානු මහ කොමසාරිස්" වශයෙනි.

## තානාපතිවරුන්ගේ හා රාජ දූතයන්ගේ කාර්යභාරය

- තම රටේ විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම
- තම රටේ පුරවැසියන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීම
- තම රට මඟින් දනුම් දෙන වැදගත් පණිවිඩ ලබා දීම
- තම රටේ ප්‍රතිපත්ති අවබෝධ කර ගැනීම
- තම රට පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීම
- රාජ්‍ය අතර මිත්‍රත්වය වැඩි දියුණු කිරීම
- දේශපාලන, සමාජ, ආර්ථික හා බුද්ධිමය සබඳතා වර්ධනය කිරීම
- තම රට නියෝජනය කිරීම මෙන් ම තම රටේ රාජ්‍ය නායකයා නියෝජනය කිරීම

**තානාපතිවරුන් හා රාජ්‍ය දූතයන් තුළ තිබිය යුතු ගුණාංග**

- තම වෘත්තියේ නිදහස, නීතිරීති, ක්‍රමෝපායන්, න්‍යාය ධර්ම සහ ආචාර ධර්ම පිළිබඳ මනා අවබෝධයෙන් ක්‍රියා කිරීම
- තම රට පිළිබඳ ව මෙන් ම තමා සේවය කරන රටේ හා ලෝක දේශපාලනයේ ස්වභාවය පිළිබඳ මනා අවබෝධයකින් පසු වීම
- රාජ්‍ය උපාය උපක්‍රම බේරුම්කරණය (Arbitration) සමගිකරණය (Concilation) හා සහමන්ත්‍රණය (Negotiation) පිළිබඳ දැනුවත් වීම
- ජාත්‍යන්තර නීති රීති හා ජාත්‍යන්තර දේශපාලන ප්‍රවණතාවන් තම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීම

2. ජාත්‍යන්තර වෙළඳාම

ලොව කිසිදු රටකට තමන්ට අවශ්‍ය සියලු දෑ නිපදවා ගැනීමේ හැකියාවක් නොවන බව මීට ඉහත අපි සාකච්ඡා කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස ආනයන - අපනයන කටයුතු රාජ්‍ය අතර සිදු වේ.

නිදසුන් ලෙස ශ්‍රී ලංකාව තේ අපනයනය කිරීම, ඇමරිකා එක්සත් ජනපදය විසින් තිරිඟු පිටි අපනයනය කිරීම වේ.

අන්තර්ජාතික වෙළඳාම ප්‍රධාන ආකාර 02ක් සිදු වේ.

1. ද්වි පාර්ශ්වික වෙළඳාම
2. බහු පාර්ශ්වික වෙළඳාම

ද්වි පාර්ශ්වික වෙළඳාම යනු රටවල් දෙකක් අතර සිදුවන වෙළඳ ගනුදෙණුවක් වේ. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාව චීනය වෙත රබර් අපනයනය කිරීම හා චීනයෙන් සහල් ආනයනය කිරීම දැක්විය හැකි ය. ද්වි පාර්ශ්වික වෙළඳාම සිදු කිරීමේ දී අදාළ දෙරට අතර ගිවිසුමක් ඇති කර ගනු ලැබේ.

**බහු පාර්ශ්වික වෙළඳාම**

රටවල් දෙකකට වඩා වැඩි ගණනක් අතර සිදු කෙරෙන වෙළඳාම බහු පාර්ශ්වික වෙළඳාම වේ. මෙම බහු පාර්ශ්වික වෙළඳාම තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ එක් රටකින් ආනයනය කරන භාණ්ඩවල වටිනාකම වෙනත් රටකට අපනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකම වෙනත් රටකට අපනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකමින් ගෙවීමට හැකි වීමයි. නවසීලන්තයෙන් කිරිපිටි ආනයනය කරන බව ද, ඇමරිකා එක්සත් ජනපදය සඳහා ඇඟලුම් අපනයනය කරන බව ද උපකල්පනය කරමු.

ශ්‍රී ලංකාව — අපනයනය → ඇමෙරිකා එක්සත් ජනපදය
ඇඟලුම්

ශ්‍රී ලංකාව ← ආනයනය — නවසීලන්තය
කිරිපිටි

ඉහත වෙළඳ ගනුදෙණුව තුළ ශ්‍රී ලංකාව නවසීලන්තයෙන් කිරිපිටි ආනයනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල ඇමරිකා එක්සත් ජනපදයට ඇඟලුම් අපනයනය කිරීමෙන් ලැබෙන ආදයමෙන් ගෙවීමට උපදෙස් දිය හැකි ය. එම අවස්ථාවේ දී නවසීලන්තය එම වටිනාකම වෙනුවෙන් වෙනත් භාණ්ඩයක් හෝ සේවාවක් ඇමරිකා එක්සත් ජනපදයෙන් ලබා ගත හැකි ය.

**ජාත්‍යන්තර වෙළඳම තුළ භාවිත වන ප්‍රබල මුදල්**

- ඇමෙරිකානු ඩොලර්
- ස්ටර්ලින් පවුම්
- යුරෝ
- ජපන් යෙන්

**විදේශ වෙළඳම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන**

- යුරෝපා පොදු වෙළඳ හවුල
- උන්ක්ටාඩ් සංවිධානය
- ගැට් සංවිධානය
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

## ක්‍රියාකාරකම්

- විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන දෙකක් තෝරා ගෙන ඒවායේ සාමාජිකයන්, අරමුණු ආදිය පෙළ ගස්වන්න.

## යුද්ධය

ජාත්‍යන්තර සබඳතා පවත්වන තවත් එක් මාර්ගයක් ලෙස යුද්ධය හැඳින්විය හැකි ය. මෙය සාමකාමී ජාත්‍යන්තර සබඳතා මාධ්‍යයක් නොවේ. පාර්ශ්ව දෙකක් හෝ වැඩි ගණනක් අතර ඇති වන්නා වූ ගැටලු සහගත තත්ත්වය යුද්ධය ලෙස සරල ව හැඳින්විය හැකි ය. (10 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය පෙළපොතේ 5 වන පරිච්ඡේදය තුළ මේ පිළිබඳ ව විස්තරාත්මක ව සාකච්ඡා කර තිබේ) රටවල් අතර ඇති වූ යුදමය තත්ත්වයන්ට හොඳ ම නිදසුන පළමු හා දෙවන ලෝක යුද්ධ වේ. රටක් ඇතුළත ඇති වූ යුද්ධ සඳහා ශ්‍රී ලංකාවේ පැවති සන්නද්ධ අරගලය පෙන්වා දිය හැකි ය.

යුද්ධය හේතුවෙන් ජාත්‍යන්තර සම්බන්ධතා අභියෝගයට ලක් වේ. සරණාගතයන් යුද්ධයේ එක් ප්‍රතිඵලයකි. සරණාගතයන් වශයෙන් වෙනත් රටවල් කරා පුද්ගලයන් සංක්‍රමණය වීම හේතු කොට ගෙන අන්තර්ජාතික සම්බන්ධතා පළුදු විය හැකි ය. එහෙත් සමහර රටවල් විසින් සරණාගතයන් ස්ව කැමැත්තෙන් තම රට තුළට ඇතුළු කර ගනු ලබයි.

තව ද විනාශ වන දේපළ හා අනෙකුත් සම්පත් නැවත යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් අවශ්‍ය ආධාර උපකාර ලබා ගැනීමට සිදු වේ. ඒ සඳහා ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනඟා ගත යුතු ය. එසේ නොවුණහොත් යුද්ධයෙන් පසු ඉතා අසරණ තත්ත්වයට පත්වීමට රාජ්‍යයන්ට සිදු වේ.

ජාතික ආරක්ෂාව තහවුරු කොට පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අවි ආයුධ ලබා ගැනීමට ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කර ගැනීම අවශ්‍ය වේ. අභ්‍යන්තර හා බාහිර යුදමය අවධානමක් පවතින රටවල ජාතික ආරක්ෂාව වෙනුවෙන් ජාත්‍යන්තර සහයෝගය නැතිවම බැරි ය.

## විදේශ ආධාර

විදේශ ආධාර සැපයීම සඳහා ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් ව පැවතීම අත්‍යවශ්‍ය වේ. සංවර්ධිත රටවල් මෙන් ම එසේ ආධාර කළ හැකි මට්ටමක පසුවන වෙනත් රාජ්‍යයන් විසින් ද ආධාර සපයනු ලැබේ. නිදසුනක් ලෙස ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ දුම්රිය මාර්ග සංවර්ධනය වෙනුවෙන් විදේශ ආධාර සැපයීම පෙන්වා දිය හැකි ය.


සංවර්ධනය වන රටවල මහා පරිමාණ බැර කර්මාන්ත, යටිතල පහසුකම්, සුභසාධන සේවා, ආර්ථික අංශවල දියුණුව වෙනුවෙන් විදේශ ආධාර ලබා දෙයි.



මහවැලි ව්‍යාපාරයට අයත් ජලාශ



දැදුරු ඔය සංවර්ධන යෝජනා ක්‍රමය



උතුරු දුම්රිය මාර්ගය හා මහා මාර්ග සංවර්ධනය

විදේශ ආධාර සපයන ආකාර කිහිපයක් වේ. එය පහත සටහනින් නිරූපණය වේ.

විදේශ ආධාර

- පරිත්‍යාග
  - මුදල්
  - මුදල්
  - ගොඩනැගිලි හා සේවා
- ණය
  - පොලී සහිත ණය
  - පොලී රහිත ණය
  - දිගු කාලීන ණය
  - කෙටි කාලීන ණය
- භාණ්ඩ හා සේවා

විදේශ ආධාර සපයන රටවල් කිහිපයකට නිදසුන්

- ඇමරිකා එක්සත් ජනපදය
- එංගලන්තය
- ජපානය
- ඉන්දියාව

විදේශ ආධාර සපයන සංවිධාන කිහිපයකට නිදසුන්

- ලෝක බැංකුව
- ආසියානු සංවර්ධන බැංකුව
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

**ක්‍රියාකාරකම්**

- විදේශ ආධාර සපයනු ලබන රටවල් තුනක් හා සංවිධාන තුනක් තෝරා ගන්න. ඒවා ඇසුරු කර ගෙන ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඔවුන් සිදු කර ඇති සේවා වෙන වෙන ම ලැයිස්තු ගත කරන්න.

**සාමය**

රටක සාමය පැවතීම සියලු දෙනාගේ ම සතුටට හේතු වේ. මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා වීම සඳහා මෙන් ම ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලනික ආදී සෑම ක්ෂේත්‍රයක ම අභිවෘද්ධිය ඇති වීමට සාමය අත්‍යවශ්‍ය වේ. රටක සාමය පවත්වා ගෙන යාම සඳහා සෑම පුරවැසියෙකු ම වගකීමෙන් කටයුතු කළ යුතු ය. පටු වාර්ගික, ආගමික හෝ වෙනත් භේද පදනම් කොට ගෙන භේද භින්න නොවී කටයුතු කිරීම තුළ සාමය ගොඩනැගෙයි. ගැටුම් ඇති නොවේ. ලෝක සාමය ඇති කිරීම සඳහා පිහිටුවා ගත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

## සංවර්ධනය

රටක සාමය ස්ථාපිත වන විට සංවර්ධනය නිතැතින් ම සිදු වේ. සාමයක් නොපවතින රටක හමුදාව නඩත්තු කිරීම, අවි ආයුධ මිල දී ගැනීම, සරණාගතයන් යුද්ධයෙන් මිය යන සහ අංග විකලවූවන් රැක බලා ගැනීම, විනාශ වන දේපළ නැවත ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් අතිවිශාල ධනස්කන්ධයක් වැය කිරීමට සිදු වේ. රටේ සමස්ත ආදායමෙන් විශාල ප්‍රමාණයක් ඉහත දක්වන ලද දෑ වෙනුවෙන් වැය කිරීම තුළ අනෙක් සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන් කළ හැකි මුදල් ප්‍රමාණය අවම අගයක් ගනියි. නැතිනම් සංවර්ධන වැඩසටහන් කපා හැරීමට සිදු වේ. එම නිසා යුද්ධය හේතුවෙන් රටක සංවර්ධනය මුළුමනින් ම අඩාල වේ. නැතිනම් බිඳ වැටෙයි.

එම නිසා සාමකාමී වාතාවරණයක් පවතින රටක සංවර්ධන ඉලක්ක වෙනුවෙන් යුද්ධය සඳහා වියදම් කළ මුදල් යෙදවිය හැකි ය. එවිට ආර්ථික, සමාජ සංවර්ධනය වේගවත් වේ. නව රැකියා අවස්ථා උත්පාදනය වේ. ජනතාවගේ ක්‍රය ශක්තිය (භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව) ඉහළ යයි. ගුණාත්මක ජීවන තත්ත්වයක් උදා වෙයි. ඉතිරි කිරීම් ඉහළ යයි. එවිට නව ආයෝජන ඇති වේ. සමස්ත රටේ ආර්ථිකය ශක්තිමත් වේ.

## ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵල

යහපත් ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගා ගැනීම තුළ පහත දැක්වෙන ප්‍රතිඵල අත් විඳීමට හැකියාව ලැබේ.

- ජාත්‍යන්තර සුහදතාව වර්ධනය වේ. මේ නිසා සෑම රාජ්‍යයක් ම මිත්‍ර ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. හදිසි අවස්ථාවන්වල දී ආධාර සහ අනුග්‍රහ දක්වයි.
- නව රැකියා අවස්ථා උදා වීම
- හදිසි අවස්ථාවල දී අන්‍යෝන්‍ය ආධාර උපකාර ලැබෙයි.
- නව තාක්ෂණික දැනුම හුවමාරු කර ගත හැකි ය.
- සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලැබේ.